# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2113/61 - 2019 මාර්තු මස 08 වැනි සිකුරාදා - 2019.03.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### කල්මුනේ මහනගර සභාව

2011 වන වසරේ සැප්තැම්බර් මස 30 වැනි දිනැති අංක 1725/22 දරන අති විශෙෂ ගැසට් පත්‍රිකාව මගින් පළකරන ලද දැන්වීම් අවලංගු කිරීමේ නිවේදනය

කල්මුනේ මහනගර සභාවේ පුරපති වන මා මහනගර සභා ආඥාපනතේ අංක 252 වන පරිච්ඡේදයේ 14(5) වගන්තිය යටතේ මා වෙත පවරන ලද බලතල ප්‍රකාරව 2011 වන වර්ෂයට අදාළ පළාත් පාලන මැතිවරණය අවසන්වී එයට අදාළ සභිකයන් තෝරා ගන්නා තෙක් කල්මුනේ මහනගර සභාවේ විශේෂ කොමසාරිස්වරයෙකු වශයෙන් සේවයේ යෙදී සිටිය එම්. එම්. නව්ෆල් මහතා විසින් 2011 වසරේ සැප්තැම්බර් මස 30 වන දින සහිතව අංක 1725/22 යටතේ ප්‍රකාශයට පත්කරනු ලැබූ ගැසට් පත්‍රිකා නිවේදනය මින් ඉදිරියේ වලංගු නොවන ආකාරයෙන් මේ මගින් අවලංගු කරමි.

නීතිඥ ඒ. එම්. රකීබ්,
මහනගර සභා පුරපති,
කල්මුනේ මහනගර සභාව.

2019 පෙබරවාරි මස 25 වැනි දින,
කල්මුනේ,
මහනගර සභා කාර්යාලයේ දීය.

03 - 1051

1A - G 29609 — 19 (2019/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## කල්මුනේ මහනගර සභාව

### කල්මුනේ මහනගර සභා සීමාව තුළ ඝණ අපද්‍රව්‍ය ඉවත්කිරීමේ කළමනාකරණ සේවා ලබාදීම සඳහා වූ බදු විස්තර අඩංගු නිවේදනය

අංක 1952 වසරට අයත් අංක 06 දරන පළාත් පාලන අධිකාරී පනත යටතට (පනතේ අතුරු විධිවිධාන) ගෙන එන ලද 1989.01.28 දිනැති අංක 541/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රිකාව මගින් පළකර ලැබූවද නැගෙනහිර ආණ්ඩුකාරවරයා විසින් 1999.08.13 වැනි දිනැති අංක 1093 දරන පළාත් පාලන ගැසට් පත්‍රිකාවෙහි පළකර ලැබූ පනත අනුව ලැබූ අනුමැතිය මත ඉහත සඳහන් කර ඇති පළාත් පාලන අධිකාරී (පනතේ අතුරු විධිවිධාන) ආඥාපනතේ 03 වන වගන්තිය යටතේ වන අංක 1240 හා 2002.07.06 දිනැති පළාත් පාලන ගැසට් පත්‍රිකාවේ පළ කර ලැබූ පනත මගින් කල්මුනේ මහනගර සභාව මගින් පිළිගන්නා ලද අතුරු විධිවිධානවල XI කොටස යටතේ (අපද්‍රව්‍ය ඉවත්කිරීම සම්බන්ධ අතුරු විධිවිධාන) සටහන් යොදන ලද අංක 04 දරන අතුරු විධිවිධානය මගින් කල්මුනේ මහනගර සභාව සතු බලතල ප්‍රකාරව ද 2013 වසරේ මාර්තු මස 27 වැනි දින පළ කර තිබූ අංක 1808 දරන අති විශෙෂ ගැසට් නිවේදනය තුළින් ක්‍රියාත්මක වූ ඝණ අපද්‍රව්‍ය ඉවත්කිරීමේ කළමනාකරණ සේවා බද්ද කල්මුනේ මහනගර සභාවේ 2019.01.14 වන දින අනුමත කරගත් පරිදි 2019 වසරට අදාළ අයවැය වාර්තාවෙහි සඳහන් වූ පරිදි පහත පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙමි.

| *අනු අංක* | *ඝණ අපද්‍රව්‍ය සේවා ලබන්නාගේ වර්ගය* | *ඝණ අපද්‍රව්‍ය ඉවත්කිරීමේ කළමනාකරණ සේවා බද්ද රු.* |
|---|---|---|
| 01 | පදිංචි නිවස සඳහා එක් දිනකට | රු. 10.00 |
| 02 | ව්‍යාපාර ස්ථානය සඳහා එක් දිනකට (ආපනශාලාව, භෝජනාගාර, කෙසෙල් වෙළෙඳ ආයතන, හැර) | රු. 15.00 |
| 03 | කර්මාන්ත ශාලා සඳහා එක් දිනකට | රු. 20.00 |
| 04 | ආපනශාලාව, භෝජන ශාලා, කෙසෙල් ව්‍යාපාර ස්ථාන, හා හරක් මස්, එළුමස්, කුකුල් මස්, මාළු යනාදි විකුණන ස්ථානවල් සඳහා කි. ග්‍රෑම් 01 (1 KG) | රු. 5.00 |
| 05 | භාවිතා කළ එක් කුරුම්බ ගෙඩියට හෝ තැඹිලි කුරුම්බ සඳහා (හරියාකාරව දෙකකට කපන ලද) | රු. 1.00 |

ඉහත සඳහන් ඝණ අපද්‍රව්‍ය ඉවත්කිරීමේ කළමනාකරණ සේවා සියල්ලම 2019 වසරේ ජනවාරි මස 15 වැනි දින සිට ක්‍රියාත්මක කරනු ලැබේ.

නීතිඥ ඒ. එම්. රකීබ්,
මහනගර සභා පුරපති,
කල්මුනේ මහනගර සභාව.

2019 පෙබරවාරි මස 25 වැනි දින,
කල්මුනේ,
මහනගර සභා කාර්යාලයේ දීය.

03 - 1052

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.